# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date – 2024.12.28 පැය 1535 | දුරකථන අංකය Tel.NO – 011-2887973 | මගේ අංකය My NO – D/Media/Out/1896 /2024 | විද්‍යුත් ලිපිනය E-Mails – dir.media@police.gov.lk |


**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. 2024.12.27 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 03 | 03 | 10 | 1025 | - |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.12.27 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සෙවනගල පොලිස් වසමේ මිහිඳුපුර ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 780 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගම්පහ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වූ යක්කල ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

ගම්පහ පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03.** **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.12.27 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් යක්කල පොලිස් වසමේ ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය ආසන්න ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 800 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගම්පහ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන යක්කල ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

ගම්පහ පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04.** **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාලච්චේන කඳවුර.**

2024.12.27 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා වාලච්චේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වාලච්චේන පොලිස් වසමේ මීරාවුඩේ ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 18 සන්තකයේ තබා ගනිමින් ත්‍රීරෝද රථයක ගමන් කරමින් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වාලච්චේන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන වාලච්චේන ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

වාලච්චේන පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05.** **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.12.27 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් දොම්පේ පොලිස් වසමේ තිත්තපත්තර ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 මිලි ග්‍රෑම් 300 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන දොම්පේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන තිත්තපත්තර ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

දොම්පේ පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය.